# සිද්ධි SIDDHI

## සුන්දර බෝකුන්දර

පසුගිය වසර කිහිපයේ සන්නස පුවත්පතේ මා ලියූ ''සිද්ධි'' කතා පෙළ නැවතුන තැනින් නව ආරම්භයක් දෙන්නට මා දිරිමත් කළ නිර්මාණශීලී ලේඛක පුවත්පත් කලාවේදී ජගත් ජේ. එදිරිසිංහයන්ගේ යෝජනාව මත ගෙවූ වසර ගණනාවේ මතක සටහන් ලියලමින් දළුලමින් නැවත පටන් ගැනේ. ඒ අතීතාවර්ජනය අද මෙතැන් සිට.........

1994 වර්ෂයයි. මා රැකියාව කළ අගනුවර ප්‍රසිද්ධ ප්‍රචාරකායතනයේ බොහොමයක් අනුග්‍රාහකයින්ගේ ප්‍රචාරක දැන්වීම් කටයුතු අතර ගේ දොර ඉඩම් හා ෆිනෑන්ස් සම්බන්ධව ආයතනයක කටයුතු වල වෙළඳ දැන්වීම් සකසන්නට වගකීම මට භාර වූ බැවින්, සමාගමේ දියුණුව සඳහා වෙහෙසක් දැරීමට සිදුවුණි.

මෙයට මා එතරම් ම කැමැත්තක් නොමැති වුව ද මාගේ රැකියාවේ ස්වාභාවය නිසා එය කරන්නට සිදු වුණි. මා හා සම්බන්ධව වැඩ කළ දිවයිනේ වෙළඳ ප්‍රචාරකායතන වල මුල් පෙලේ සිටි පිටපත් රචකයකු බොහෝ විට මෙවැනි දැන්වීම් ලියන්නට මැලිකමක් දැක්වීය.

'' බලනවා අතුල, දැන් මේ පොල් වතු ටිකයි, අන්නාසි වතු ටිකයි, වෙළ වල් ටිකයි, දුප්පත් මිනිසුන්ගේ රබර් කෑලි ටිකයි ගොඩ කරලා කඩලා විකුණලා දනවා. මට නම් මේ කරුම වලට අතගහන්න බෑ කියලා ලොක්කට කියනවා''. ඔහුගේ බලවත් අකැමැත්ත ප්‍රකාශ කළේ දැඩි කණගාටුවකින්. ඔහු කවදත් එකහෙළාම සත්‍ය ප්‍රකාශ කරන්නට කැමැතිය. ඔහුගේ අදහස මා ද අනුමත කරමි.

බොහෝ වේලාවට මා ඡායාරූප ශිල්පියකු ද රැගෙන විකුණන ඉඩ කඩම් වලට යන්නේ ඒ හා සකස් කෙරෙන වෙළඳ දැන්වීම් වලට අවශ්‍ය පරිසරය සකස් කර ගන්නටය. මෙවැනි තැන් වලට ගියාම මගේ සිතට ද දැනෙන්නේ කෙමෙන් කෙමෙන් අපේ පරිසරය විනාශ වී ගෙන යන පෙරනිමිතිය. මිනුවන්ගොඩ ප්‍රදේශයේ මා ගිය තැනෙක විශාල අන්නාසි වගාවක් පස පෙරළා ඩෝසර් කර ගෙන යනු පෙනිණි. අනුග්‍රාහක සමාගම එවා ඇති කඩදාසි කැබැල්ල කියවා බැලීමි.

තෙකලා විදුලිය, පානීය ජලය, සිහිලැල් සුවය, කී.මී. දුරින් පාසල්, ආරෝග්‍ය ශාලා මෙකී නොකී දෑය. එනමුත් මෙතැන ඒවා පෙනෙන්නට නම් වසර ගණනාවක් යනවාය. ඊළඟ සතියේ පුවත්පතේ පළ කෙරෙන්නේ සුන්දර රූපයක් සමඟ මෙවැනි නම්ය.

''ස්ප්‍රින්වැලි ගාඩ්න්ස්, සමනළ උයන, නිල්දිය උයන, සල්මල් උයන, සොඳුරු විමන'' ඔවැනි නම් වලින්ය. දිනක් මා මිත්‍රයකු හමු වී ඇසුවේ, ''උඹලා ඔය කියන ලස්සන දේවල් වලට 15% ක වට්ටමක් රූපවාහිනීයෙන්, පත්තර වලින් දෙනවා නේද?'' කියාය. එවිට අසළ සිටි අනෙකා කීවේ ''ලස්සන දේවල් වලට නෙමේ බොරු වලට 15%ක වට්ටමක් දෙනවා නේද?'' කියාය. තෙකලා විදුලිය කියා තිබුණාට මහා මාර්ගයේ සිට හැතැප්ම ගාණක් කණු දමන්නට වෙනවාය. පානීය ජලය සොයන්නට බඹ ගණනක් හාරන්නට වෙනවාය. සිහිලැල් සුළඟ, සිහිලැල් සුවය කොහිද? මදුරුවන් පිරි මඩවගුරුය.

මේ සකස් වන වෙළඳ දැන්වීම් රැගෙන ගොස් අනුමත කරවා ගෙන එන්නට විධායක නිලධාරීනියක් සේවය කළාය. ඇය අපි ''ග්ලෙන්ඩා'' නමින් හඳුන්වමු. ඇය කාර්යක්ෂම සේවිකාවක් වූ අතර අපට හිසරදයක් වූයේ වැඩක් කරන්නට දුන් සැනින්ම ආපසු රැගෙන යන්නට එන නිසාය.

සමහර දින වල රැය නිදි මරා සකස් කළ දැන්වීම් ද ඇයගේ හිතුමනාපයට වෙනස් කරන අයුරු දැක මා හා වැඩ කළ අයට ද රුස්සන්නේ නැත. විශේෂයෙන්ම මේ හා සම්බන්ධව වැඩ කටයුතු කරනා පිටපත් රචකයාට ඉවසීමේ සීමාව ඉක්මවා ගොසින්ය. කොයිවේලේ හෝ විධායක නිලධාරිනියගේ, පිටපත් රචකයාගේ ද මගේ ද සුහද මිත්‍රත්වය පුපුරා යන වග මා දැන සිටියෙමි.

දිනක් සවස් යාමයේ වැඩ අවසන් වන වේලාවේ ''ග්ලෙන්ඩා'' කලබලයෙන් දුවගෙන ආවේ මා වෙතය. ''අතුල හෙට මේක පත්තරේට යනවා. රෑට කරලා තියන්න, මං උදේට ගන්නම්''.
කියමින් ඈ තවත් කටයුත්තකට හදිසියේ ගියාය. මගේ අනෙක් පසින් පැමිණි පිටපත් රචකයා ''ඇයි ගත්තේ... ඔන්න ඔක විසිකරලා දනවා.

වැඩ වේලාවෙන් පස්සේ කරන්න. මේක මාර රාජකාරියක්නේ..... අනික මොනවත් නෙමෙයි ඔය බර අදින්නේ කොතලාවල ආර්යාවගේ ගජ යාලුවනේ'' යි නොඉවසුම් වදන් පිටවුණි. ඔහු මට තරයේම කියා සිටියේ මෙයට නම් ඔහුට කොපියක් ලියන්නට බැරි බවයි. කෙසේ නමුත් ''බෝකුන්දර'' නිවාස ඉඩ කඩම් විකිණීම පිළිබඳව වෙළඳ දැන්වීම එදින රෑ කිරීමට මට නොහැකි විණි. පසුද පාන්දරම මා රැකියාවට ආවේ මොනයම් හෝ සාධාරණයක් මේ වෙළඳ දැන්වීමට කරන්නටය.

නමුත් කාර්යාලයට ඇතුල් වන විටම බොහෝ දෙනෙකුගේ මුහුණෙන් දුටුවේ මාත් සිදුවීමකට වගකිවයුත්තකු බවය.

''අන්න හරි වැඩේ තමා.... ග්ලෙන්ඩා කාමරේ හොඳටම අඬනවා''. ඇයට හිතවත් ඉන්දිරා මට කියුවේ අමනාප ස්වරූපයකිනි. මම ඇගේ කාමරයට වහා දිව ගියෙමි. ඇය මා හා කිසිවක් නොදෙඩාම කේන්තිය පිටකරගත්තේ ඇඬීමෙනි. ඇගේ ෆයිල් මිටියට ඔබ්බෙන් විශාලව අත්අකුරින් ලියූ පිටපතක් දිස්වෙයි. මම එය වහා කියවීමි.

''සුන්දර බෝකුන්දරින් ''
ගින්දර ගානට ඉඩම්
පාන්දරින්ම ගොස් ගන්න
වතුර අත ළඟ පනිට්ටුව ලිඳ ලඟ.

යන ශීර්ෂ පාඨයෙන් යුත් කොපියයි. මෙය දුටු මට නවත්වාගන්නට බැරි සිනහවක් ආවද එය සඟවා ග්ලෙන්ඩා ගේ කේන්තිය නිවා දැමීමේ කාර්යයේ යෙදුනෙමි. පසුව වෙනකෙකු ලවා කොපියක් ලියවා කාර්යය නිම කළෙමි. එදින මෙය ලියූ පිටපත් රචකයා සේවයට වාර්තා නොකළ අතර එය ආයතන ප්‍රධානියා දක්වා ගිය කරුණක් විය. මා දන්නා පරිදි මෙය ආයතන ප්‍රධානියාට ද හාස්‍යයට තුඩුදුන් කරුණකි.



## නිදහසක් නැති නිදහස

නිදහස් දිනය ළං වන විට අනුග්‍රාහක සමාගම් ඉල්ලා සිටින්නේ ඔවුන් වෙනුවෙන් වෙළඳ දැන්වීමක් නිර්මාණය කරන්නටය. ඒ දින වලට නිදහසක් නැත්තේමය. එක් එක් ආකාරයෙන් නිදහස් දැන්වීම් කරන්නට අලුත් සංකල්ප ඉදිරිපත් කළ යුතුය. එක්තරා දිනයෙක මා භාරව ප්‍රචාරක කටයුතු කරන ප්‍රසිද්ධ ලොතරැයියකට නිදහස් දින දැන්වීමක් නිර්මාණය කරන්නට යෝජනා කළාය. මෙහි නිර්මාණ කිරීමට පෙර සිංහල, ඉංග්‍රීසි,දෙමළ පිටපත් ලියන්නන් ඒ හා සම්බන්ධ විධායක නිලධාරී, කලා අධ්‍යක්ෂක ඇතුළු කිහිපදෙනෙකු එකතු වී සංකල්පයක් සකසා ගන්නට වෑයම් ගත්තේය. මෙදින රැස්වීමට ආයතන ප්‍රධානියා ද සහභාගී වුණි.

පැය දෙකක් පමණ සාකච්ඡා කළ ද හරියන නැවුම් සංකල්පයක් කා හටත් නොමැති විය. ආයතන ප්‍රධානියා ද කලකට පෙර සිටි පිටපත් රචකයෙකු හා මධ්‍යවේදියෙකු ද විය. ඔහුට ද දැනෙන්නේ නිර්මාණශීලී පිරිසට කිසිම අදහසක් මේ දැන්වීම ගැන නැතිබව යන හැඟීමකි. මට දැන් පෙනෙන්නේ ඔහුගේ දෙඇස සියල්ලම වටා කැරකැවෙමින් දැඩි වූ තරහා ස්වාභාවයකි. '' අයිසේ තමුන්ලට මේ වගේ දෙයකටවත් අදහසක් එන්නේ නැද්ද?. බලනවා කොච්චර වෙලා කතා කළාද? මොනවද මේ කරන්නේ''.

ඔහු වහා පිළිගැනීමේ නිලධාරිනියට කතා කළේය. ''කියනවා රාජාට එන්න කියලා'' ''කට්ටියට තේ ගෙන්න කියලාද?.........'' පිළිගැනීමේ නිලධාරිනිය අනෙක් කොනෙන් ඇසුවාය. ''තේ නෙමෙයි, රාජාට එන්න කියනවා''. ප්‍රධානියා අඩි හප්පා කළ ප්‍රකාශයෙන් සියල්ලෝම තිගැස්සී නිහඬ විය.

රාජා අප ආයතනයේ කාර්යාල සේවකයාය. ඔහු ද්‍රවිඩ ජාතිකයෙකි. ඔහු ද කියූ සැනින් දිව එන්නේ ඔහුට අකරතැබ්බයක් දේ සැකයෙනි.
''ෂර්..... මට කතා කළාද?.....
රාජා කියනවා බලන්න මේ මහත්තුරුන්ට තේරේන්නෑ නිදහස් දවසට AD එකකට දන්න ඕන මොනවද කියලා.....
ෂර්, අපි කොඩිය දනවා, පරයියා දනවා, ෂිංහල ඇඳුම අඳිනවා......''

රාජා කියාගෙන යන කතාවට හීන් සිනාවකුත් සමඟ ප්‍රධානියාගේ සැර බාල වේ.

''අන්න දැක්කනේ, රාජාට එච්චරවත් හිතන්න පුළුවන්නම්..... බලනවලා අලුත් දෙයක් කරන්න''

වස ලැජ්ජාවකි. තවත් පමා නොවූ මා රැස්වීම අවසානයේ ෆොන්සේකාට කතා කොට කාරයක් ද රැගෙන ගියේ නිදහස් චතුරශ්‍රයේ කෙළවර පිහිටි හැටේ වත්තටයි. නානාවිධ පුද්ගලයින් ගැවසෙන මේ අඩවියේ කාර් එක වටා රොක් ගැහෙන්නට කොලු ගැටයින් පිරිසක් විය. ඉන් එකෙකුගෙන් මුදල් ගෙවා එක් එක් ජාතියේ එක් එක් පාටින් යුතු පරවියන් කිහිපදෙනෙකු ද අර කොලුවා ද ගෙන ගියේ නිදහස් චතුරශ්‍රයේ සිංහ ප්‍රතිමාව ළඟටයි. ඡායාරූප ශිල්පියා ද පැමිණුනි. බිමට සහල් ටිකක් දමා සිංහ රූපය අසළ පරවියන් ඇහිඳ කන දර්ශනය ඡාරූපගත කෙරුණි. වැඩේ අවසන්ය. මෙම නිදහස් වෙළඳ දැන්වීමේ සිංහල කොපිය මම ලිව්මී.

''වර්ණ ජාති භේදයෙන් තොර එකම ජාතියක්. නිදහස් සෙවනේ'' යන ශීර්ෂ පාඨයෙන් දැන්වීම සකස් කළෙමි. එය නිදහස් දවසට අලුත් අර්ථයක් දුන් මාතෘකාවක් වූයේය. ද්‍රවිඩ ජාතිකයෙකු වූ රාජාගේ කතාවත් සමඟ වෙනත් ඉසව්වක් කරා හිත යොමා මේ වැඩේ ගොඩ ද ගැනීම එද මා සිතට සුවදයක වූයේය.

අතුල කල්දෙමුල්ල



kaldemulla@gmail.com